# 12

# බෙලෙක්

ජනප්‍රිය කලා මාධ්‍යයක් වශයෙන් කෙටිකතාවට සාහිත්‍යයේ දී ලැබෙනුයේ සුවිශේෂ ස්ථානයකි. කිසියම් අත්දැකීමක් පාදක කරගෙන ජීවිතයේ අංශු මාත්‍රයක් විවරණය කරමින් අප තුළ රසයක් ජනිත කිරීමට කෙටිකතා රචකයා උත්සාහ ගනී. බොහෝ විට එක ම සිදුවීමක් මුල් කොටගෙන කෙටිකතා රචනා වෙයි. චරිතාංගයක් මුල් කොට ගෙන ද ලියවෙයි. මිනිස් සිතේ යම් කිසි අවස්ථාවක් නිරූපණය වන කෙටිකතා ද රචනා වෙයි. යම්කිසි චෛතසික අවස්ථාවක් නිරූපණය වන කෙටිකතා ද ඇත. කෙටිකතාවක චරිත හෝ සිද්ධි සුළු ප්‍රමාණයකි. එහෙත් චරිත නිරූපණයක් ඇත. කියවා රස විඳීමත් භාෂා කෞශල්‍යයත් ජීවිත අත්දැකීමකුත් කෙටිකතාවක් මඟින් අපට ලබා දෙයි නම් එය සාර්ථක කෙටිකතාවකැ යි කිව හැකි ය. කීර්ති වැලිසරගේ නම් සම්මානලාභී කෙටිකතාකරුවා විසින් ලියැවුණු මේ කෙටිකතාව කියවීමෙන් ඔබට

- කෙටිකතාවක අංග ලක්ෂණ දැන ගැනීමටත්,
- අද්‍යතන සාහිත්‍ය නිර්මාණවල කැපී පෙනෙන භාෂා රටා, සම්ප්‍රදායයන් හා සුවිශේෂ ලක්ෂණ විස්තර කිරීමටත්,
- කෙටිකතා කියවා රස විඳීමටත්,
- අත්දැකීමක් ඇසුරෙන් සරල කෙටිකතාවක් නිර්මාණය කිරීමටත් අත්වැලක් සැපයෙනු ඇත.

පට්ටා ගැසුණු දුඹුරු පැහැ කොට කලිසමක් සහ දුර්වර්ණ වූ නිල් කොටු කමිසයකින් නිතර සැරසී සිටිනා ඔහු මාදින්නාගොඩ කවුරුත් හඳුනා ගෙන සිටියේ 'බෙලෙක්' යන නමිනි. ගොරෝසු හිස කෙසින් හා දෙබැමින් ද තවමත් උඩු තොලේ හා නිකටේ වැඩී ගෙන එන රැවුලකින් ද යුත් ඔහුගේ මුහුණ රවුම් විය. අඩි හතර හමාරකට වඩා උස් නො වූ ඔහුගේ දෙපයේ රබර් සෙරෙප්පු යුවලක් වැරදුණේ නැත. රබර් සෙරෙප්පු දෙක රැකියාව විසින් ඔහුට අනිවාර්ය කරනු ලැබ තිබිණි.

ලෑලි පාලම පසු කොට ගුරු පාර දිගේ මඳ දුරක් ගිය තැන වම් පසින් ඇත්තේ දර මඩුවකි. දර මඩුවට යාබද ව ලෑලිවලින් තැනූ කුඩා කාමර කෑල්ලක් වේ. බෙලෙක් ජීවත් වන්නේ මේ කාමර කෑල්ලට කුලී ගෙවා ගෙන ය. දර මඩුව අයිති දබරේගේ නිවස ඊට මඳක් එපිටින් වේ.

බෙලෙක්ගේ කාමරය ඉතා කුඩා නමුත් එහි එක් අයකුට කිසිදු අපහසුවක් නොමැති ව රාත්‍රිය ගත කිරීමට ඉඩ කඩ තිබුණි. සිනමා නළු නිළියන්ගේ ද අයෝමය පුරුෂයන්ගේ ද ඡායාරූප පළ වූ පත්තර සඟරා පිටු නො ඇලවූ තැනෙක ලෑලි බිත්තියේ එල්ලූ බෝල කුඩුවේ ඔහුගේ ඇඳුම් දෙක තුන විය. ඔහු නිතර ඇන්දේ දුඹුරු පැහැ කලිසමත් නිල් කොටු කමිසයත් වුව ද තවත් කොට කලිසමක් හා කමිසයක් ද ඔහුට තිබිණ.

වයස අවුරුදු දහ නවයක් වූ ඔහුගේ රැකියාව බෙලෙක් එකතු කිරීම ය. මලකඩ බැඳුණු බෙලෙක්, ටින් පියන්, තහඩු කෑලි, කොකු යකඩ කෑලි, පයිප්ප ආදි මේ කොයිවාත් ඔහු එකතු කළේ ය. සෑම ගෙවත්තක ම පිටුපස මදුරු පණුවන්ට වාසස්ථාන වූ ටින් කබල් ආදියේ වටිනාකම දන්නේ කීයෙන් කී දෙනා ද ? මේ ගැන සිතෙන විට බෙලෙක්ගේ කළු වූ දෙතොලේ සීන් සිනාවක් ඇඳී යයි.

බෙලෙක් එකතු කිරීමට ගෙන යන කරත්ත කුලියට දෙන තැනක් වැලිකඩ වේ. සෑම දිනක ම උදේ බෙලෙක් මේ කරත්තයක් රුපියල් විස්සක් ගෙවා කුලියට ගනී. සෑම උදයක ම ගෙවීමට රුපියල් විස්සක් ඔහු පෙරදා ආදායමෙන් අතේ ඉතිරි කර ගනී. නැතිනම් සවස දෙන තුරු ඇපයට තැබීමට හැඳුනුම් පත වුවමනා ය. හැඳුනුම් පත ලබා ගැනීමේ ක්‍රමය ද හොඳ ය. බෙලෙක් හැර අනික් අය කළේ එලෙස ය. එහෙත් හැඳුනුම් පතක් නැති බෙලෙක්ට එය කළ නො හැකි ය. එබැවින් දවස අවසානයේ රුපියල් විස්සක් පසු ද කරත්ත කුලිය සඳහා ඉතිරි විය යුතු ය. ඊට අමතර ව තවත් රුපියල් දහයක් මාසයේ මුල සෑම දිනක ම දබරේ අත තැබීමට ද ඔහු පුරුදු ව සිටියේ ය. මෙසේ රුපියල් දහයක් දෙන සෑම වරක ම කාමරයේ ලෑල්ලක පැන්සල් ඉරක් ඇඳිණි. ඉරි කැබලි පහළොවක් සම්පූර්ණ වූ පසු මාසයේ කුලිය දූන් ගෙවී ඇතැයි ඔහු දබරේට දන්වයි. කෑම බීම ද ගෙවල් කුලී කොටස හා කරත්ත කුලිය ද ආදි සෑම වියදමක් ම අවසානයේ ඉතිරිවන යම් මුදලක් වෙතොත් එය ඔහු පෙට්ටියේ ද ඉබ්බා දමයි. බෙලෙක් රාජකාරියට පිටත්වන්නේ උදෑසනින් ම ය.

වත්තකට ඇතුළු වන සෑම විටක ම ඒ වත්තේ ඉන්නා පිරිමි ටින් කබල් එකතු කරගෙන යනවාට මුල දී ම කැමැත්ත දක්වති. එහෙත් ගැහැනුන් බලන්නේ වපරැසිනි. වටිනාකමක් නැති ටින් කබල් අවුස්සන මානයෙන් අවුත් සොරුන්ට ඔත්තු සපයතැයි ඔවුන්ගේ අවිශ්වාසයක් වේ. ඔවුහු එය එළිපිට ම ප්‍රකාශ කිරීමට ද ඇතැම් විට මැළි නො වෙති. එහෙත් බෙලෙක් එකතු කිරීමේ කලාව මැනවින් ප්‍රගුණ කොට ඇති බෙලෙක් නොමනාපයෙන් මුහුණ පුළුටු කර ගෙන බලා ඉන්නා ගෘහිණියන්ට පෙනෙන්නට මුලින් ම එකතුකර ගන්නා සාඩින් ටින් දෙක තුනක රැඳුණු පල්වතුර හලා දමා මිටියෙන් තළා ගෙන ගොස් මෙසේ කියයි.

"මේවෑ මදුරු පණුවො............ මුං විද්දම තමා බරවා හැදෙන්නෙ........"

බෙලෙක් ඉන් එහා ඒ ගැන කතා කිරීමට නො යයි. ගෘහිණියගේ මුහුණින් වැහි වලාකුළු පහව යනු ඔහුගේ හොරැහැට පෙනේ.

වතු හතර පහක් ඇවිදින විට කරත්තය පිරේ. ඉන් පසු ඔහු වහ වහා බෝතල් කඩය කරා පැමිණෙයි. බෙලෙක් කිලෝවක් බෝතල් කඩය මිලයට ගන්නේ රුපියල් එකයි ශත පනහ ගණනේ ය. වෙහෙස නොබලා එකතු කළ හොත් එක දෙක වන විට කිලෝ තිහ හතළිහක් සොයා ගැනීම එතරම් දුෂ්කර කාර්යයක් නො වේ. දිවා ආහාරය කඩයකින් ගන්නා හේ විවේකයක් නොගෙන ම ඊළඟ වටය අරඹයි. ඒ වටයෙන් ද කිලෝ විස්සක් විසි පහක් සොයා ගැනීම සිදු වේ. සවස පහ පසුවන විට මුදල් ගනුදෙනු බේරා ගෙන රෑ කෑමට යමක් ද ගෙන බෙලෙක් නිදහසේ කාමරයට එයි. නැත්නම් චිත්‍රපටයක් බලන්නට යයි.

ඇතුළුකෝට්ටේ පසුකොට දැන් බෙලෙක් බත්තරමුල්ල පැත්තේ ඇවිදී. එහි එන අතුරු මඟක් වුව අවුරුද්දක් එකතු කළත් ඉවරයක් කළ නොහැකි යැ යි ඔහුට සිතේ.

දහවල් වන තුරුත් එක සීරු වැහි ඇද හැළුණෙන් බෙලෙක් රැකියාවට යාමේ අදහස අත් හැරියේ ය. අහසේ වැසි වලාකුළු පිරී තිබුණෙන් ඉක්මනින් පායාවි යැයි සිතා ගැනීමට ද ඉඩක් නො විණි. බෙලෙක් එකතු කරන්නට යාම මෙබඳු දිනවල අසීරු බැවින් දවස අත්හැරීමට ඔහු කල්පනා කළේ ය.

දහවල් දෙළහ එක වන විට අහසේ තිබූ වැහි වලාකුළු කෙමෙන් පහවී ගොස් හොඳින් හිරු බැබළෙන්නට විය. කම්මැළිකමින් දර මඩුවේ කොටයක් මත හිඳගෙන පාර බලා හිඳීම ඇති වූ පසු බෙලෙක් කළේ කමිසය හැඳගෙන පිටත් ව යෑම ය.

කොටියාගොඩ පාලම අසල බෙලෙක්ගේ මිතුරෙක් සිටියි. බෙලෙක් එහි යන විට මිතුරා කුකුළකු ගෙන එන්නට කොලොන්නාවට ගොස් සිටියේ ය. මඳ වෙලාවක් පාර අයිනේ සිටගෙන ඉඳහිට පාරේ දිවෙන වාහන දෙස බලා හුන් බෙලෙක් මිතුරා මුණ ගැසීමේ අදහස පසෙකට ලා ආපසු ඒමට පිටත් වූවේ ය.

සැතපුම් ගණන් පයින් ඇවිදීම රැකියාව කොටගෙන සිටින බෙලෙක්ට මේ ටික දුර පයින් ඇවිද ගෙන ඒමේ අමුත්තක් නැත. එහෙත් සෑම ද තනියට ඔහු හා ගමන් කරන කරත්තය නොමැත්තෙන් ඔහුට පාළුවක් දැනිණි. ගීයක පද උරුවම්බාමින් ඔහු එමින් සිටියේ ය.

"කීයද්ද අම්ම දුන්නෙ.............? "
"රුපියල්............"
"කියහංකො ගිලින්නෙ........."

පාර අයිනේ බිමට නැමී ගත් වන ම මොනවාදෝ සොයමින් හුන් දැරියන් දෙදෙනෙකුගේ කතා බහින් බෙලෙක්ගේ ගමන මඳකට නැවතිණි. බැලූ බැල්මට අවුරුදු දහසයක් දහ හතක් පමණ කිව හැකි අක්කා කෙළින් වී අට නව හැවිරිදි නැගණිය යැයි සිතිය හැකි දැරියට බැණ වදින්නට පටන් ගත්තා ය. බෙලෙක් ඔවුන් පසු කර යනවාත් සමඟ ම අක්කාගේ ටොකු

පහරක් නැඟණියගේ හිසෙහි පතිත විණි. යන ගමන ඉබේ ම නැවතී, ඔහු පාර අයිනේ සිටගෙන දබරය නරඹන්නට වූවේ ය.

කුඩා දැරිය හැඳ සිටියේ ඉරී ගිය කඩමාල්ලකි. ඒ ගවුම ඇගේ උස මහතට කොහෙත් ම නොගැළපෙන එකකි.



යාන්තම් ඉඟෙන් පහළට එල්ලෙන එසවුණු පැත්තකින් බිම වාඩි වීමෙන්දෝ ගුරු පැහැ වූ කලිසමක කොටසක් දිස් වේ. වැඩිමලියගේ ඇඳුම ඒ හැටි ම දුර්වර්ණ නොවුණත් එය ද ඇගේ පමණට කුඩා එකකැ යි බෙලෙක්ට සිතිණි. ඔවුහු අවුල් තඹ පැහැ කෙහෙවලු උණ්ඩි කොට බැඳ සිටියහ.

"දුන්නොත් කෑව .......... ඊ රී ...... හොයපං බලං ඉන්නෙ ........ නැත්නං අද කළුවරේ තමයි ඉන්න වෙන්නෙ ........ යස්සනී ..........."

අක්කාගේ අවලාදයෙන් නැඟණිය නැවතත් නැමී ගත් වන ම පාර අයිනේ දූවිලි ද, තණ කොළ බිස්ස ද පයින් අවුස්සමින් සොයන්නට වූවා ය.

"මෙතෙන්ට එනකල් තිබ්බ ද ? "
"තිබ්බ.......... "
"ඊට එහා හරියේ දී තමයි වැටුණෙ........"
"වැවුණෑ ........... වැවුණෑ තමයි........."

කෝපයෙන් කට ඇද කොට එසේ කී අක්කා ද අසුලා ගත් කෝටු කැබැල්ලකින් තණකොළ පීරමින් සොයන්නට වූවා ය. ඔවුන් සොයන්නේ කාසියක් වියයුතු යැයි බෙලෙක් අනුමානයෙන් සිතා ගත්තේ ය. දූලි වැදී කළු ගැසුණු බෝතලය ද , රාත්‍රිය කළුවරේ ගත කරන්නට සිදුවෙතැ යි අක්කා කළ අනතුරු ඇඟවීම ද එක් ව ගත් කල භූමිතෙල් ගෙනෙන්ට ගෙනා කාසිය කුඩා දැරිය අතින් නැති වී ඇති බැව් හොඳ හැටි පැහැදිලි ය. එය රුපියල් පහේ කාසියක් විය යුතු ය.

පාර අයිනේ සිට ගෙන මේ අක්කා නගෝ දෙස බලා සිටීම සුදුසු ද යි අනතුරු ව බෙලෙක්ට කල්පනා විණි. ඔහු කඩිනමින් අඩි කීපයක් ගමන් කළේ එහෙයිනි. අහසේ කොනක දිස්න දෙන හිරු පඬු පැහැ තද ආලෝකයක් විහිදුවයි.

හිරු දෙසට මුහුණ ලා යමින් සිටි බෙලෙක් හදිස්සියේ ම ආපසු හැරී ආ මඟ බැලුවද අක්කා හෝ නැඟණිය එක් වරට ම පැහැදිලි ව දැක ගත හැකි නො විණි. දෑස් තිලංකාරය ගෙවී රූප පැහැදිලි වන විට මඳක් ඉදිරියට අවුත් නැමී ගත් වන ම කෝටුවෙන් තණ කොළ බිස්ස පීරන අක්කා ද , දෙදණේ දෑත් ඔබා ගත් වන ම මහපොළොවේ දූවිලි කැටයක් ගානේ සෝදිසි කරන නැඟණිය ද දැක ගත හැකි විණි.

බෙලෙක්ගේ සිතෙහි අනුකම්පාවක් ඉපදිණි. ඔහු සිත මෙළෙක් වන්නට විය. ඔහුගේ දකුණත කොට කලිසම් සාක්කුව බලා ගොස් එහි වූ මාරු කාසි කිහිපය හසු කොට ගෙන ආපසු ආවේ එහෙයිනි. අතට ගත් රුපියල් දෙකේ ශත පනහේ රුපියලේ කාසි අතර රුපියල් පහේ කාසිය අත්ලේ රඳවා ගනිමින් ඉතිරි කාසි සාක්කුවට දමා ගත්තේ ය.

කාසිය අතට ගත්ත ද එය ඔවුන් හට දෙන්නේ කෙසේ දැයි බෙලෙක්ට සිතාගත නොහැකි ය. ඔවුන් බැණ වැදුණ හොත් ? නන්නාඳුනන තමා වැන්නකු අතින් දෙන මුදල ආපසු දමා ගසා බැණ වැදුණ හොත් ඇතිවන ලජ්ජාව විඳ දරා ගන්නේ කෙසේ ද? එහෙත් ඒ සමඟ ම එසේ ඔවුන් තමාට බැණ වැදීමක් නො කරනු ඇතැයි විශ්වාසයක් ඔහුගේ සිතෙහි ජනිත විණි. ඒ විශ්වාසයත් සමඟ ම බෙලෙක් අඩි කිහිපයක් පෙරට තබා දැරියන් වෙත සමීප වීම ආරම්භ කළේ ය. එසේ වුව ද කඩින් කඩ දෙපොළක නැවතී ඔහු දැරියන් වෙත ළං වූයේ දෙගිඩියාවෙනි. ඔවුන්ගේ ගෙවල් දොරවල් ඇත්තේ ළඟ අහල පහළක නම් තමා කාසිය දීමට යන විට ඔවුන් ගෙදරට ඇසෙන්නට කෑ ගසා "මෙන්න කවුදෝ මිනිහෙක් අපිට සල්ලි දෙනවා......." යි කීවොත් යන බියෙන් ඔහු තප්පර කීපයක් පසු බස්වනු ලැබිණි. එහෙත් ඒ වන විට ද තමන් දෙස, අතේ උණ්ඩි කරගත් දෙයක් තව තවත් උණ්ඩි කර ගනිමින් තරුණියකු බලා සිටිනවා දැරියන් දැක තිබිණි.

ආගන්තුක තරුණයා දෙස වැඩි මහල්ලියගේ සැකමුසු බැල්ම කුඩා වූ දෙනෙත්වලින් පළවිණි. ඇගේ නළලේ සිහින් රැලි කිහිපයක් මතු වී තිබිණි. නැඟණියගේ බැල්ම ඊට වෙනස් විය. ඉවකින් මෙන් බලාපොරොත්තු සහගත බවක් ඇගේ බැල්මේ දක ගත හැකි විය. ඒ බැල්ම තරුණයාගේ මිට මෙළවුණු අත්ලට ද මුහුණට ද වරින් විට මාරු වෙමින් පැවතිණි. හදිස්සියේ ම බෙලෙක් තම මිට මෙළවුණු අත්ල දිග හැර එහි වූ රුපියල් පහේ කාසිය දැරියන් වෙත දිගු කළේ ය. ඒ සැණින් කුඩා දැරිය සිය අත්ල පෑවා ය.

"අයියා ද ඇහුල්ලේ .................. ?"

බෙලෙක් පස්සට විසි වූ අතර ඔහු වහා තම අත මිට මොළවා ගත්තේ ය. එය අසුලා ගත්තක් නො ව, තමාගේ ම රුපියල් පහක් බව එසේ ප්‍රකාශ වන්නට සැලැස්වූ හේ, තමාට ඕනෑ නම් එය දීමට ද, නැත්නම් නොදීමට ද ඇති අයිතිය පළකරමින් අඩියක් පස්සට තැබුවේ ය. එහෙත් නැඟණිය පමණක් නො ව කාසිය දුටු ඇසිල්ලේ ඇගේ අක්කා ද බෙහෙවින් වෙනස් වූ අතර එය ඔහු කෙසේ හෝ තමන්ගේ ඇස් වසා අසුලා ගන්නට ඇතැ යි විස්වාස කරනා බවක් පළ විණි.

"මගේ රුපියල් පහ ........... වැටුණ රුපියල් පහ .........."

"නෑ .......... මේ මගේ සල්ලි .........."

"එහෙනං දෙන්නෙ..........? "

කුඩා දැරිය ඇස් ගෙඩි උලුප්පාගෙන අසයි.

තමා මුදල් දෙන්නේ මන් දැ යි හදිස්සියේ ම බෙලෙක් ද නැවතත් සිතන්නට වූ බවක් පළ විණි. ඇයි ? තමා කාසිය දෙන්නට සිතුවේ ඇයි ද යන්න ඔහුට හැඟී යතත් එය වචනයට නගා පළ කිරීම අසීරු ය. මුවට නගා ගත යුතු වචන සිතාගත නොහැකි ව අසරණ වූ බෙලෙක් ගේ දෙතොල් වියලී තිබිණි.

"කෙල්ලනේ .......... තොපි මක්කොන්නවද ඔතෙන්ට වෙලා.........?"

තහඩුවක් දෙකට ඉරා දමන විට නැගෙන්නාක් බඳු තියුණු වූත්, කර්කෂ වූත් හඬකින් දැරියන් ඇමතූ ඔවුන්ගේ මව යැයි සිතිය හැකි ස්ත්‍රිය දුටු ඇසිල්ලේ බෙලෙක් කොතෙක් තැති ගත්තා දැ යි කිවහොත් සැබෑ වංචනිකයෙකුගේ ස්වභාවයක් ඔහු කෙරෙන් පළවිණි. තම පසු පසින් ඇසුණු වාහනයක නළා හඬින් තිගැස්සී ගිය හේ නිනව් නැත්තෙකු සේ වට පිට බැලී ය.

මවගේ කට හඬ ඇසුණු ඇසිල්ලේ කුඩා දැරිය වහා ඇය වෙත දිව ගියා ය. නිසැකයෙන් ම මවට සිද්ධිය දැන්වීමට පෙරාතු ව මේ උගුලින් ගැලවී අතුරුදන් වීමට මඟක් නොමැත්තෙන් මහත් සේ කැළඹීමට පත්වූ ඔහු වහා තම අල්ලේ උණ්ඩි කර ගත් කාසිය වැඩිමහල් දැරිය

වෙත දිගු කළේත්, එක් විට ම ය. දැරිය මව වෙත දිව යන්නට පය එස වූයෙත් එක් විට ම ය. එහෙයින් දැරිය, ඔහු අත දිගු කරනු දුටුවේ නැත. බෙලෙක් ඒ සමඟම ආපසු හැරී කඩිනම් අඩි කිහිපයක් පෙරට තැබුවේ ය. එහෙත් ඔහුට අඩි හතර පහකට වඩා ඉදිරියට යාමට නො හැකි විණි. ''ඒයි...... ඔහොම හිටපං............ දැක්ක ද ආඳා වගේ ලිස්සල යන්න හදන හැටි........."

දෙකන් කීරි ගස්සන කටුක ගැහැනු කට හඬක් බෙලෙක් පසු පසින් මතුවිණි.

බෙලෙක් ගල් ගැසුණේ ය. ඔහුට හීන් දාඩියක් දමමින් තිබිණි. උගුලකට හසුවූ සතෙකු ඉන් බේරී පලා යන්නේ කෙසේ දැයි නොදැක බියපත් වන්නේ යම් සේ ද  එබඳු ම බියකට තරුණයා ද පත්විණි.

හීන්දෑරි ස්ත්‍රිය කටු ඉපලක් මෙන් දිස් විය. ඇගේ රතු දෙතොල් කෙළවර නිරන්තරයෙන් බුලත් සැපීම නිසා පැළී ගිය රෝස පැහැ රේඛා කැපී පෙනිණි. ඇගේ උස් තියුණු හඬින් අවට පැල්පත් දෙක තුනක ගැහැනු ද, කොලු කුරුට්ටෝ ද  වහා බෙලෙක් වට කොට වළල්ලක් පරිද්දෙන් සිට ගත්හ.

"ඕ මේ අර බෙලෙක් නෙ උඹ කොහෙද බං............. මෙහේ.......... ?"

බෙලෙක් හඳුනා ගත් කඩමාලු දිග ගවුමක් හැඳ සිටි ගැහැනියක් කීවා ය. ඔහු ඇය දෙස රවා බැලූ නමුත් වහා තමා පත් ව ඇති තත්ත්වය තේරුම් ගනිමින් තම බැල්ම වෙනස්කර ගත්තේ ය. කළු අත්කොට බැනියමක් හැඳගත් මරුමුස් ගැටවරයෙක් ගොදුරක් දුටු කොටියකු මෙන් කුරුමානම් අල්ලමින් සිටියේ ය. කොයි මොහොතේ හෝ ඔහුගේ මිට මෙළවුණු අතින් මුහුණ හරහා පහරක් එල්ල වෙතැයි බෙලෙක් පසු වූයේ සෝදිසියෙනි.

"ඇහුලුවනං දීපං රුපියල් පහ............"

"දෙන්න හැදුවෙ........... ඇහුලුවෙ නෑ............"

"හැජුව........... එහෙනං දීහංකෝ ........... ඇයි යකෝ .......... තෙල් ටික ගේන්න රුපියල් පහ දුන්නෙ. තොගෙ අල්ල හිල් වෙලා ද යකෝ ඒක හලා ගත්තෙ.........?

ස්ත්‍රිය අවසාන වචන ටික කීවේ කුඩා දැරියගේ හිසට ටොක්කක් අනිමිනි.

"ඌයි " ගා පහත් වූ දැරිය බෙලෙක් දෙස බලා දත් විලිස්සුවා ය. "ඇච් චැච් චැච් චැච්............"

"ඉතිං ඇහුල්ල නං දෙන්න කියපල්ලකෝ..........."
"හහ්, මාරු වෙන්න හදන්නේ..........."
"මාරු වෙන්න ......... අඩෝ........."

හදිස්සියේ ම කුමක් වුවත් ඇත්ත කියා සිටිය යුතු බැව් බෙලෙක්ට වැටහිණි. වචන ........... ඔහුට නැත්තේ වචන ය. එහෙත් වහා ඇත්ත කිව යුතු ය.

"මගෙයි රුපියල් පහ.......... මං දෙන්නයි හැදුවේ.........."

කොතෙක් උත්සාහ කළත් ඔහුගේ මුවින් පිට වන්නේ ඒ වචන දෙක තුන පමණි.

"දෙන්න........"

"උඹගෙ ලු .......... ආයි දෙන්න ලු හුඃ.......... හුඃ.......... "

දුර්වර්ණ දිග ගවුමින් සැරසුණු අනික් ගැහැනිය අත්පුඩියක් ගසා නැමී දැත දෙදණේ ගසා ගනිමින් කොක් හඩලා සිනාසුණා ය. ඒ සමඟ ම දෙතුන් දෙනෙකු එකවර කතා කිරීමට පටන් ගත්තෙන් කිසිවක් පැහැදිලි ව නැසිණි.

මෙය තේරුම් කර දෙන්නේ කෙසේ ද? කළු විදුරු මසේ නෙරූ නල දත පෙන්නා ගෙන ඉන්නා ගැටවරයා දෙස බලා බෙලෙක් හිස කැසුවේ ය.

ඒ සමඟ ම හදිසි අදහසක් ඔහුගේ සිහියට නැගුණි. ඔහු හනික රුපියල් පහේ කාසිය සහිත අත්ල දිගු කළේ ය.

"ඔන්න........."

පහදා දෙන්නට හෝ තර්ක කරන්නට නොම ගොස් කාසිය දී යාම හොඳ ය යන්න ඔහු සිහියට නැගුණු අදහස ය. ඔහු එසේ කාසිය පෑවේ එබැවිනි. දූරියන්ගේ මව වහා ඉදිරියට පැන අතින් රුපියල් පහ ඩැහැ ගත්තී එය දෑසට ළං කොට නරඹන්නට වූවාය. මොහොතකින් ඇගේ දෑසේ වූ රළු පෙනුම වෙනස් වන්නාක් මෙන් බෙලෙක්ට හැඟිණි. ස්ත්‍රිය කාසිය දෙපැත්ත පෙරළමින් හොඳ හැටි පරීක්ෂා කොට බලනු දැක ගත හැකිවිණි.

"මං බැලුවෙ කාගෙද පහ කියල, කෝ මගේ ඇහැ පේනවා.........."

හඳුනා ගත්තා, නොගත්තා ඊළඟ තප්පරයේ වහා අත්ල කාසිය ද සමඟ උණ්ඩි වී පහළට වැටී අනතුරුව දිග ගවුම් සාක්කුව තුළට ද යැවිණි. ඇගේ මුවින් ඒ වචන පිට වනවාත් සමඟ ම බලාපොරොත්තුවකින් බෙලෙක්ගේ දෙනෙත් ප්‍රාණවත් විය. ඒ සමඟ ම මෙතෙක් වෙලා අමතක ව තිබූ වචනයක් ද ඔහුට සිහිපත් විණි.

"පවු හින්ද දෙන්න ගියේ .........." යි කියවෙත් ම ඔහුගේ දෙනෙත වැඩිමහල් දූරිය දෙසට හැරිණි. රැස්ව සිටිනා අයගෙන් වැඩියෙන් ම නිර්දෝෂී භාවය ඔප්පු කරගත යුත්තේ ඇයට යැයි ඔහු සිතුවාක් මෙනි.

මං දුන්න පහට වඩා නං මේක අලුත් පහේ........... මට මතකක් නෑ එතකොට එහෙනං මං මේකිට දුන්න පහ කෝ..........?

"ඒක හොය හොය හිටියෙ මං එන කොට.........."

"ඇහිලුවෙ..........."

"මං ඇහිලුවෙ නෑ ......... පවු හින්ද මගෙ රුපියල් පහ දෙන්න හැදුවේ ......."

ස්ත්‍රිය වහා කුඩා දැරිය වෙත හැරුණා ය.

"උඹ දැක්ක ද අහුලනවා.........?"

"නෑ ........."
"ඇහිලුවෙ නෑ.......... මං දෙන්න ගියෙ පවු හින්ද.........?"

බෙලෙක් වාසනාවකට මතක් වූ ඒ වචනය නැවත නැවත යොදමින් සිද්ධිය පැහැදිලි කිරීමට උත්සාහ කළේ ය. අනතුරුව කලිසම් සාක්කුවේ වූ සියලු කාසි එළියට ඇද ගත්තේ ය. සුදු පැහැ රුපියල් දෙකේ කාසිය ද, රුපියලේ කාසිය ද ශත පනහේ කාසිය ද එතන විය. ඔහු උඩ සාක්කුවෙන් කොළ පැහැති රුපියල් දහයේ කොලයක් ද ගෙන පෙන්නුවේ ය.

"මේ සල්ලි, අද වැස්සේ නැත්තං මං මේ වෙන කොට අසුවක බෙලෙක් විකුණලා හෙට කරත්තෙට දෙන රුපියල් විස්සත් වෙන ම තියෙනවා............ තව පෙට්ටියෙත් තියෙනවා. මට නම් ඕන් නෑ අනුන්ගෙ සල්ලි.......... මං අර පවු කියල........

බෙලෙක් මුදල් ටික නැවත සාක්කුවලට දමා ගත්තේ ය.

කෙට්ටු ස්ත්‍රියගේ උල් දෑසට කාසි අතර පොට්ට පාට වූ රුපියල් පහක් නො වූ බව හොඳට ම විශ්වාස ය.

"ඔව් ........... ඔව් ............ හොරෙක් නෙමෙයි ........... මං දන්නැද්ද හම්බු කොන්න එකා ............. ඇයි වදේ "

මුලින් ම තරුණයා හඳුනා ගත් ස්ත්‍රිය කීවා ය. ගවුම් සාක්කුවෙන් රුපියල් පහ ගෙන කුඩා දැරියගේ අත්ලේ ඇන්න මව ඇගේ උරහිසින් අල්ලා ඉදිරියට තල්ලු කළා ය.

"පල ගිහිං භූමිතෙල් කාල දූන් වත් ගෙන ........... ඉතුරු නොහල ........ බලා ඉන්නෙ..............."

කුඩා දැරිය බිම  දමා තිබූ බෝතලය ද ගෙන වහා පැන දිව්වා ය.

"යමං බං යන්ඩ........... තව පොඩ්ඩෙන් අයිනව හොම්බ රිවට් වෙන්න..........."

මරුමුස් ගැටවරයා තවත් කොලුවෙකු ද තල්ලු කරගෙන නික්ම ගියේ ය. වටවූ පිරිස ද බිමට නැඹුරු කරගත් දෙනෙත්වලින් තණ කොළ හා දූවිලි තීරුව පිරික්සා බලමින් අලස ලෙස විසිර යන්ට වූහ.

"දැක්ක ද මේකිගෙ තරම............ බෝම්බෙ............ රුපියල් පහ නැති කොරං ......... තව පොඩ්ඩෙං මේ ළමය අහුවෙන්නේ බලං කෙල්ලේ ඇති ඔය කොහේ හරි විසි වෙලා ............ ඇයි අස්ප ගාය නෙ මුංට............. ඇහිලුවොත් මේ ළමයට දීල යවන්නත් බැරියෑ..........."

"මට ඕන්නෑ ............ මං ........... යනවා............."

බස් රියක් කළු දුම් පිට කරමින් ඔවුන් පසු කොට ඇදී ගියේ ය. දුව ගොස් එහි එල්ලෙන්නට සිතුණ ද බෙලෙක් ඒ සිතුවිල්ල ක්‍රියාවට නැගුවේ නැත.

ගැහැනිය දවසකට රුපියල් අසූවක් සොයන තරුණයා දෙස බලා බුලත් කසට බැඳි දත් දැන්ද පා සිනාවක් නැගුවා ය. එය ඉතා ළෙංගතු සිනාවකි. අවුරුදු දහ හතක දහ අටක දියණියක සිටිනා ඕනෑම පැල්පත් වාසී අම්මා කෙනෙකුගේ ළෙංගතු සිනාවක් නැගීමේ අරුමයක් නැත. වැඩිමහල් දැරිය ද බිම තණ කොළ පාගමින් බෙලෙක් දෙස හොරැහින් බැලුවා ය.

"අර තියෙන්නේ අපේ ගේ.............."

ස්ත්‍රිය පාර අද්දර අටවා තිබූ කුඩා තහඩු පැල්පත දැක්වූවා ය.

"ඒක ද? "

"ඔව් ............ ඔය යන එනකොට එන්න බැරියැ.............."

බෙලෙක් බියෙන් සැකයෙන් තොර ව දැරිය දෙස බලා සිනාවක් පා ආපසු හැරී ගමන් කරන්නට වූවේය. යාර විස්සක් තිහක් ගොස් ආපසු බැලූ ඔහුට මවත් වැඩි මහල්  දියණියත් පාරෙන් මඳක් ඉවතට වන්නට නැමී රුපියල් පහ සොයනු දැක ගත හැකිවිණි.

පසුදා උදයේ ද අහස අඳුරු කර තිබූ නමුත් බෙලෙක් රැකියාවට පිටත්ව ගියේ ය. මහත්වූ ප්‍රබෝධයක් ඔහුගේ කඩිනම් ගමනින් ද වැඩ පළින් ද පළවිණි. ඔහු පෙරේද වට  වැස්සෙන් වතුර පිරුණ ටින් කබල් එකතු කොට මිටි පහර දී තලා ගෝනියට දමා ගත්තේ වේගයෙනි.

උදයටත් සවසටත් තව එක වත්ත බැගින් වැඩි කළ හොත් රුපියල් සියයකට කිට්ටු මුදලක් එකතු කර ගන්නට අසීරු දැ යි ඔහු ගණන් බැලුවේ ය.

කරත්තය තල්ලු කරගෙන යන බෙලෙක්ගේ මුවින් ගීයක පද මිමිණෙන්නේ ඉබේට ම ය. ඔහුගේ හදවතේ මුල්ලක කිතිකැවෙන බලාපොරොත්තුවකි.

## ක්‍රියාකාරකම 01

**මේ කෙටිකතාව කියවා පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. කෙටිකතාකරු බෙලෙක්ගේ ස්වරූපය දක්වා ඇත්තේ කෙසේ ද?
2. බෙලෙක්ගේ චරිතයේ ඔබ දකින විශේෂ ලක්ෂණ මොනවා ද?
3. පිරිමින් බෙලෙක් එකතු කරන අයට කැමති ඇයි ?
4. බෙලෙක්ගේ සකසුරුවම්කම ගැන ඔබට කුමක් කිව හැකි ද ?
5. ඔහු නො මනාපයෙන් සිටින ගෘහණියන් සතුටු කිරීමට යොදන උපක්‍රමය කුමක් ද?
6. බෙලෙක් මුහුණ පෑ අසීරු අවස්ථා පැහැදිලි කරන්න.
7. කතාව අවසානයේ ඔහුගේ සිතේ ඇතිවුණු බලාපොරොත්තුව කුමක් දැ යි සඳහන් කරන්න.

## ක්‍රියාකාරකම 02

සංවාදවල දී කටවහර බෙහෙවින් යොදා ගැනේ. මේ කෙටි කතාවේ දැක්වෙන එවැනි සංවාදයක් පහත දැක්වේ.

"දැක්ක ද මේකිගෙ තරම ................ බෝම්බෙ .............. රුපියල් පහ නැති කොරහං .............. තව පොඩ්ඩෙන් මේ ළමය ව අහුවෙන්නෙ. බලං කෙල්ලෙ ඇති ඔය කොහෙ හරි විසිවෙලා ඇයි අස්ප ගාය නෙ මුංට .............. ඇහිලුවොත් මේ ළමයට දීල යවන්නත් බැරියෑ ..........."

"මම ඕන්නෑ ............. මං යනවා"

- මෙවැනි සංවාද යෙදෙන තවත් අවස්ථා තුනක් කෙටි කතාවෙන් උපුටා ලියන්න.

**කට වහරින් යෙදී ඇති මේ ඡේදය ලිඛිත භාෂාවෙන් ලියන්න.**

මං ගෙදර ඉඳල පාරට බහින කොට ම කළු කපා එළිය වැටිල. මිනිස්සු එහෙ මෙහෙ දුවන්නේ හරියට කඩියො වගේ. එක පැත්තක කරත්ත කාරයො අනික් පැත්තෙ එක එක්කෙනා තරගෙට පදින බයිසිකල් කාරයො. මමත් ගියා ඉස්සරහට ම ඔන්න බොලේ බුඃ බුඃ ගා ගෙන ළඟ ගෙදර බල්ලෙක් පාරට පැන ගෙන ආපි. මං බිරාන්ත වෙලා ගියා. ඒ පාර මං ඒ ළඟ තිබ්බච්ච වැටෙන් කෝට්ටක් කල්ල ගත්තම බල්ල ගේ ඇතුළටම දුවපි. ඔහොම යන කොට හම්බ උණේ පාළු පාර ඒ කාලෙ ලේසි පුතෙක් මේක පහු කරං ගියේ නැහැ.

මමත් ඉතින් මොකෙකුටවත් බය ඇති මිනිහෙක්කැයි ඔන්න බොලේ එත කොට ම කිසිම අංග පුලාවකට නැති මිනිහෙක් කැහැපොට ගහගෙන ඉස්සරහට ආපි. ඊට පස්සෙ තව මිනිහෙක් ආපි. මමත් ඇරියෙ නැහැ හොඳයි වරෙං කියල ගියා ඉස්සරහට ම. ඒ ගොල්ලෝ හිතන් නැති මං දුවයි කියලා. මං ඒ ජාතියෙ නං මිනිහෙක් නොවෙයි. බැලින්නම් ඒ තමයි ඒ පැත්තෙ ගනං කාරයෝ.

තවත් මෙවැනි කටවහරින් යෙදුණු වාක්‍ය සොයා ගෙන පන්ති කාමරයේ අනිත් ළමයින් සමඟ එක්වී ලේඛන භාෂා ව්‍යවහාරයට හරවන්න.

## ක්‍රියාකාරකම 03

පාඩමේ එන පහත සඳහන් වාක්‍ය කියවන්න.

දුඹුරු පැහැ කොට කලිසමකින් සහ දුර්වර්ණ වූ නිල් කොටු කමිසයකින් නිතර සැරසී සිටින ඔහු කවුරුත් හඳුනා ගෙන සිටියේ බෙලෙක් නමිනි.

ගැහැනිය දෑත දෙදණේ ගසමින් **කොක්හඬලා** සිනාසුනා ය.

මේ ඉරි ඇඳි පද දෙස බලන්න. ඒවායින් එම පද විස්තර කිරීමක් සිදු වී ඇත. ඒවා **විශේෂණ** පද වේ.

විශේෂණ පද, නාම පදවලට මෙන් ම ක්‍රියා පදවලට මුලින් යෙදෙන බව මේ අනුව පැහැදිලිය.

**01 මේ කෙටිකතාවේ ඇති එවැනි නාම හා ක්‍රියා විශේෂණ පද උපුටා ලියන්න.**
උදා - **ගොරෝසු** හිස කෙසින්

**02 පහත සඳහන් වාක්‍ය සුදුසු විශේෂණ පද යොදා සම්පූර්ණ කර ලියන්න.**

i. ............ ස්ත්‍රිය ....... නැටුමක් නැටුවා ය.
ii. ........... සෙබළා ........... රට රැක ගනී.
iii. ........... ශිෂ්‍යයා පාඩම ........... කියෙව්වේ ය.
iv. ........... ඉංජිනේරුවෝ ගොඩනැගිලි ........... තැනුවෝ ය.
v. ........... ජලය ........... ගොවිතැනට සුදුසු නැත.
vi. ......... ශිෂ්‍යයෝ පාසල ඇරී ........... දිව්වෝ ය.
vii. ........... පුතාගේ ජයග්‍රහණය නිසා අම්මා ........... කාලය ගත කරයි.
viii. ........... ඔය ........... පාඩම ........... කියවන්න.
ix. ........... දුම්රිය ........... ධාවනය විය.
x. ........... රෝගියා ........... නිදයි.

## ක්‍රියාකාරකම 04

භාෂාවේ යෙදෙන එක්තරා වාක්‍ය රටාවක් පහත දැක්වේ. එම රටාවේ වාක්‍ය කීපයක් පාඩමේ ඇත. නියමිත පාඩමේ ඇතුළත් එවැනි වාක්‍ය සොයා ලියන්න.

ඉක්මනින් ගෙදර ගියොත් අපට සෙල්ලම් කිරීමට පුළුවන.
පාලම හැදුවොත් අපට පහසුවෙන් ගමට යා හැකි ය.

## ක්‍රියාකාරකම 05

බෙලෙක් රසවත් කෙටිකතාවක් බවට පත් කිරීම සඳහා කතුවරයා යොදාගෙන ඇති ක්‍රම ශිල්ප නම්

- සුවිශේෂ චරිතයක් තාත්වික ව නිරූපණය කිරීම
- උපමා යෙදීම.
- භාවික වචන යොදා තිබීම.
- ඉඟි වැකි යෙදීම.
- උත්ප්‍රාසය
- ව්‍යංග්‍යාර්ථය

යන කරුණු ය.

ඉහත සඳහන් එක් එක් කරුණු සඳහා දිය හැකි උදාහරණ පාඩමෙන් උපුටා ලියන්න. උදාහරණයක් පහත දැක්වේ.

උදා - චරිතය තාත්වික ව නිරූපණය කිරීම

මහත් වූ ප්‍රබෝධයක් ඔහුගේ කඩිනම් ගමනින් ද වැඩ පළින් ද පළවිණි. ඔහු පෙරේදා වට වැස්සෙන් වතුර පිරුණ ටින් කබල් එකතු කොට මිටි පහර දී තලා ගෝනියට දමා ගත්තේ වේගයෙනි.

## පැවරුම්

- ඔබ කියවූ වෙනත් සිංහල කෙටිකතා පිළිබඳ ව පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න. කියවා නැත්නම් සොයා ගෙන කියවන්න.

| කෙටිකතාවේ නම | කතුවරයාගේ නම | ප්‍රධාන අදහස |
|---|---|---|
| | | |

පන්තියේ අනෙක් සිසුන් සමඟ ඔබේ වගුව සසඳමින් සාකච්ඡා කරන්න.

1. ඔබ ලැබූ අත්දැකීමක් පදනම් කරගෙන සරල කෙටිකතාවක් ලියන්න.

2. ඔබ ලියූ කෙටිකතාව පන්තියේ අනෙක් ළමයින් ලියූ කෙටිකතාත් සමඟ සාකච්ඡා කරන්න.

3. ගුරුතුමා/ තුමීගේ උපදෙස් ලබාගෙන සාර්ථක කෙටිකතා තෝරා පොත් පිංචක් සකසන්න.